# අභිප්‍රායන් ඉදිරිපත් කලයුතු ක්‍රමවේදය

අභිප්‍රායන් ඉදිරිපත් කිරීමේදී පහත පියවරයන් අනුගමනය කල යුතුය.

1. සියළුම අභිප්‍රාය ලේඛන ඉදිරිපත් කරන කවරයේ ඉහල වම් කෙලවරේ ''උණවටුන Ceylon Plaza සඳහා අභිප්‍රා ලේඛන" යනුවෙන් සඳහන් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ ආපසු නොගෙවන රු.**5,000** ක මුදලක් කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ ගිණුමට බැර කර රිසිට්පත ඉදිරිපත් කල යුතුය.(ගිණුම් අංක 682974 ලංකා බැංකුව ඉඩම ශාඛාව තැන්පත් කල රිසිට් පත හෝ ගාල්ල කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලයට ගෙවූ ලදුපත හෝ ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශයට ගෙවන ලද ලදුපත)

2. මුද්‍රා තැබූ කවරය 2026.01.19 දින ප.ව.3.00 ට පෙර සභාපති, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලුපාර , කටුබැද්ද, මොරටුව. යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක. එදිනට පසුව ලැබෙන අභිප්‍රා ලේඛන සලකා බලනු නොලැබේ.

3. අභිලාෂ (අභිප්‍රායන්) විවෘත කිරීම කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කෙරේ. මණ්ඩලය මඟින් පත් කරනු ලබන විශේෂඥ කමිටුවක් මඟින් අදාල අභිප්‍රාය ඇගයීම සිදුකරනු ලබන අතර මූලික සුදුසුකම්ලත් අභිප්‍රායන් ඉදිරි ඇගයීම් සඳහා යොමු කරනු ලබයි. එම තාක්ෂණික කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

4. අභිප්‍රායන් ඉදිරිපත් කිරිමේ ක්‍රියාවලිය, කොන්දේසී පිළිබඳ දැනුවත් කිරීම Ceylon Plaza පරිශ්‍රයේදී 2026.01.08 දින පෙ.ව. 10.00 පැවැත්වීමට සැලසුම් කර ඇත.

සභාපති,
කර්මාන්ත සංවර්ධන මණ්ඩලය,
අංක 615, ගාලු පාර, කටුබැද්ද,
මොරටුව.
011 260 5887
077 803 7569 (වැඩි විස්තර සඳහා)

# ඇගයීම් නිර්නායක

අභිප්‍රායන් කැඳවීමට අදාළව නිර්නායක සැකසීම සඳහා සහ ඇගයීම් නිර්නායක ඒ සඳහා පත් කරන ලද කමිටුව විසින් සකස් කරනු ලැබේ. ඒ අනුව අභිප්‍රා ඉදිරිපත් කරනු ලබන පාර්ශවකරුවන්ගේ අභිප්‍රා යෝජනා පහත නිර්නායක ඔස්සේ ඇගයීම් සිදු කරන ලබයි.

| නිර්නායකය | විස්තරය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01.යෝජිත ව්‍යාපෘති යෝජනාව | ව්‍යාපෘති යෝජනාවේ අදාළත්වය හා ශක්‍යතාවය (විදේශීය/ ඉහල ආදායම් පිරිස් ඉලක්ක කරගත්) | 15 |
| 02. අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ආයෝජකයාගේ පූර්ව අත්දැකීම් හා පළපුරුද්ද | යෝජිත ව්‍යාපෘතියට අදාළ ක්ෂේත්‍රයේ පූර්ව අත්දැකීම් හා පළපුරුද්ද | 15 |
| 03.සංවිධාන හැකියාව | ආයෝජකයා සතු සේවක කණ්ඩායම් හා සේවක හැසිරවීම් පළපුරුද්ද | 10 |
| 04. වෙනත් ව්‍යාපෘති පිලිබඳ අත්දැකීම් හා පළපුරුද්ද | යෝජිත ව්‍යාපෘතියට පරිභාහිර ව්‍යාපෘතියක නිරත වීම තුළින් ලබා ඇති අත්දැකීම් හා පළපුරුද්ද | 10 |
| 05. මූල්‍ය ශක්‍යතාව | යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ආයෝජකයා සතුමූල්‍ය පහසුකම් ලබා ගන්නේ නම් ඒ සඳහා ප්‍රවේශය | 15 |
| 06. ව්‍යාපෘතියේ ආර්ථිකමය හා සමාජීයීය බලපෑම | යෝජිත අභිලාශ මඟින් , දේශීය කර්මාන්ත සංචාරක කර්මාන්තය,විදේශ විනිමය ඉපයීමට, දේශීය සංස්කෘතාංග ප්‍රවර්ධනයට ලබා දෙන දායකත්වය | 15 |
| 07. රාජ්‍ය පෞද්ගලික මූල්‍යමය ප්‍රතිලාභය | යෝජිත ව්‍යාපෘතිය මඟින් ස්ථානය සංවර්ධනයට ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට ලබා දෙන ප්‍රතිලාභය | 20 |

මූල්‍ය ඇගයීම් සඳහා තෝරාගනු ලබන්නේ ලකුණු 60ට වඩා ලබාගත් යෝජනා වේ.

<u>ආයෝජකයින් ලංසුකරුවන් සඳහා නියමයන් හා කොන්දේසි</u>

1. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාර ආයතනයක් හෝ විදේශීය ආයෝජනයක් නම් ශ්‍රී ලංකාව තුල ලියාපදිංචි ආයතයක් වශයෙන් හෝ නියෝජිතයෙකු ලෙස,

2. සීමාසහිත පෞද්ගලික / පෞද්ගලික පොදු සමාගමක් නම් සංස්ථාපිත කිරිමේ සහතිකය (Certificate of Incorporation or Registration)
    (i) ව්‍යවස්ථාපිත සංවිධානයක්, තනි පුද්ලග ව්‍යාපාරයක්/ හවුල් ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරිමේ සහතිකය ලබා තිබිය යුතුය.

3. ආයෝජකයා විදේශිකයෙකු වන විට ව්‍යාපාරය ඉහත කොන්දේසි අංක (1) හා (2) කොන්දේසියේ හවුල් ව්‍යාපාර ආකෘතියට ව්‍යාපාරය ලියාපදිංචි වී තිබිය යුතුය.

4. සමාගම් පැතිකඩ (Company Profile), ව්‍යාපාර සැලැස්ම (Business Plan) ඉදිරිපත් කල යුතුය .

5. ප්‍රතිලාභ ප්‍රකාශ කරන අවස්ථාවේදී අදාල සමාගම හෝ ලංසුකරු මූල්‍ය ආයතන වල අසාධු ලේඛනයක (Black List) කර නොතිබිය යුතුය.

6. ඉදිරිපත් කරන ව්‍යාපෘතිය මූලික ආකෘතියන් හා පෞරාණිකත්වයට හානි නොවිය යුතුය.

7. නව ව්‍යාපාරයක් / කර්මාන්තයක් නම් ඉහත අංක 04 සඳහන් පිළිගත් වාර්තාවක් (Business Plan) ඉදිරිපත් කල යුතුය.

8. ඉදිරිපත් කරන ව්‍යාපෘති සම්බන්ධව පූර්ව අත්දැකීම් අදාලත්වය, තාක්ෂණ මට්ටම සහ මූල්‍ය වටිනාකම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කල යුතුය .

9. කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වීම තුළ ලබා ගෙන ඇති ජාතික හා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් හා අගය කිරිම් ලබා තිබීම අමතර සුදුසුකමක් වේ.

පහත සඳහන් ක්ෂේත්‍ර ආයෝජනය කිරීම සළකා බලනු නොලැබේ. එම ක්ෂේත්‍ර වනුයේ,

01. ශ්‍රී ලංකාවේ නීතියෙන් තහනම් ව්‍යාපාර වර්ග

02. ආරක්ෂක අමාත්‍යාංශයේ නීතී රීතී වලට අනුගත නොවන ව්‍යාපාර

03. සත්ත්ව හා ශාක නිරෝධායන පනත යටතේ තහනමට ලක්ව ඇති ශාක හා සත්ව කොටස් යොදා ගනිමින් නිෂ්පාදන භාණ්ඩ අලෙවිය

04. අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතන (හබරාදූව) මඟින් අවසර නොදෙන ව්‍යාපාර අවස්ථා

05. ප්‍රදේශයේ ජන ජීවිතයට,සංස්කෘතිමය හර පද්ධතියට හානිදායක බලපෑම් කරන කර්මාන්ත.